# වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIM)
# කොළඹ විශ්වවිද්‍යාලය

## පුරප්පාඩු

කොළඹ විශ්වවිද්‍යාලයේ, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIM) විසින්, පහත සඳහන් තනතුරු සඳහා යථා යෝග්‍ය පරිදි සුදුසුකම්ලත් අයවලුන් වෙතින් 2021-08-23 වන දින දක්වා අයදුම්පත් භාරගනු ලැබේ.

**01. තනතුර : තාක්ෂණ නිලධාරි (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - ICT) තනතුරු 01**

**සුදුසුකම්** : (i) ඕනෑම විෂය ධාරාවකින් අපොස (උ/පෙළ) විභාගය, එකම වතාවකදී, විෂයයන් තුනකින් (03) සමත් වීම.

සහ

(ii) තොරතුරු සන්නිවේදන හා බහුමාධ්‍ය තාක්ෂණවේදය / තොරතුරු තාක්ෂණය හෝ සමාන ක්ෂේත්‍රයකින්, පිළිගත් ආයතනයකින් හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික/ කාර්මික/ වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කරනු ලැබූ ජාතික වෘත්තීය කුසලතා (N.V.Q.) 5 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) පිළිබඳ සේවාස්ථ පළපුරුද්දක් සහිත අය හට ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

**වයස** : වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරාගැනීම** : ලිඛිත සහ/ හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**වැටුප් පරිමාණය** : රු. 31,625 - 7X300; 10X355-37,275 මසකට 2020-01-01 දිනට (U MT 1 (III))

**2. තනතුර : තාක්ෂණ නිලධාරි (ශ්‍රව්‍ය දෘශ්‍ය) - තනතුරු 01**

**සුදුසුකම්** : (i) ඕනෑම විෂය ධාරාවකින් අ.පො.ස (උ/පෙළ) විභාගය විෂයයන් තුනකින් (03) සමත්වීම

සහ

(ii) (අ) පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ පනතක් මගින් ස්ථාපිත ව්‍යවස්ථාපිත ආයතනයකින් හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආයතනයකින් ලබාගත් විද්‍යුතය සහ විදුලි සංදේශ/ විද්‍යුතය/ බහුමාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය ශිල්පක්‍රම පිළිබඳ ජාතික වෘත්තීය කුසලතා (N.V.Q.) 5 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

හෝ

(ආ) පිළිගත් ආයතනයක ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩ පිළිබඳ එක් වසරක පළපුරුද්දක්ද සහිතව වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කීර්තිමත් ආයතනයක ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩ පිළිබඳ එක් වසරක පළපුරුද්දක් ද සහිතව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ඉහත ii (අ) හි සඳහන් සුදුසුකම් වලට සමාන සුදුසුකම් ලෙස පිළිගනු ලබන ශ්‍රව්‍ය දෘශ්‍ය ශිල්පක්‍රම හෝ විද්‍යුත් සහ විදුලි සංදේශ / විද්‍යුත්/ බහු මාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය ශිල්ප උපක්‍රම පිළිබඳ ක්ෂේත්‍රයේ තාක්ෂණික/ කාර්මික සුදුසුකම් ලබා තිබීම.

**වයස** : අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීම** : ලිඛිත සහ/ හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**වැටුප් පරිමාණය** : රු. 31,625 - 7X300; 10X355-37,275 මසකට 2020-01-01 දිනට (UMT 1(III))

**3. තනතුර : තාක්ෂණ නිලධාරි - ශ්‍රේණිය II කණ්ඩය "අ" (තාක්ෂණවේදය සඳහා තනතුරු 03 ක් සහ වෛද්‍ය රසායනාගාරය සඳහා තනතුරු 01)**

**සුදුසුකම්** : (I) ජාතික තාක්ෂණවේද ඩිප්ලෝමාව (NDT) හෝ සමාන සුදුසුකම්

හෝ

(II) ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDE)

හෝ

(III) අදාළ ක්ෂේත්‍රයේ (තාක්ෂණවේද/ වෛද්‍ය රසායනාගාර) උසස් ජාතික ඩිප්ලෝමාව (HND)

හෝ

(IV) අදාළ ක්ෂේත්‍රයේ (තාක්ෂණවේද/ වෛද්‍ය රසායනාගාර) එක් (01) වසරක පළපුරුද්දක්ද සමග පිළිගත් ආයතනයකින් ලබාගත් අඩුම තරමින් වසර දෙකක (02) පූර්ණකාලීන අදාළ ක්ෂේත්‍රයේ (වෛද්‍ය රසායනාගාර) ඩිප්ලෝමාව

**වයස** : අවුරුදු 45 ට නොඅඩු

**තෝරා ගැනීම** : ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ, පරීක්ෂණයක් මගින්

**වැටුප් පරිමාණය** : රු. 35,145-7X355; 9X495-42,085 මසකට 2020.01.01 දිනට (UMT1 (II))

අයදුම්පත් ෆෝරම, සහ අදාළ විස්තර වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIM) හි වෙබ් අඩවිය වන https://pgim.cmb.ac.lk වෙතින් බාගත කරගත හැකිය.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්, අදාළ සහතිකපත්‍රවල සහතික කළ පිටපත්ද සමග recruitment@pgim.cmb.ac.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට යොමුකිරීම හෝ කොළඹ 07, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවතේ අංක 160 හි, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ, නියෝජ්‍ය ලේඛකාධිකාරී වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම ගෙනැවිත් භාරදීම හෝ 2021-08-23 වන දිනට හෝ ඊට පෙර සිදු කළ යුතුය. ඉල්ලුම් කරන තනතුර ඊමේල් ලිපිනයේ විෂය ශීර්ෂය ලෙස හා ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ සටහන් කළ යුතුය.

අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIM) සතුය.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත් පිළිබඳව සලකා බලනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් සහ නියමිත ආකෘතියට අනුකූලව සකස් කර නොමැති අයදුම්පත් භාර ගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**අධ්‍යක්ෂක,**
**වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය,**
**අංක 160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත, කොළඹ 07.**
**2021-08-08**

**Source: Silumina (2021.08.08), www.pgim.cmb.ac.lk (2021.08.08)**